කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතිය - 2022
-----------------------------------------------------------------

කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන අන්තර් ජාතික අරමුදල අතර 2016 අප්‍රේල් 26 දින එළඹි අංක 2000001447 දරන ණය අරමුදල් ගිවිසුමේ IX ව්‍යවස්ථාවේ 9.03 (අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය**

ණය අරමුදල් ගිවිසුම අනුව, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ප්‍රදේශය තුළ කුඩා තේ හා රබර් වතු හිමියන්ගේ ඵලදායී, ලාභදායී හා නම්‍යශීලී ආර්ථික කටයුතු තවත් වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය අරමුදල් ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 8,502 කට සමාන වූ එජඩො මිලියන 65.4 වන අතර ඉන් රු. මිලියන 3,349 කට සමාන වූ එජඩො මිලියන 25.77 ක් සැපයීම සඳහා කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන අන්තර් ජාතික අරමුදල සමඟ එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු. මිලියන 5,153 ශ්‍රී ලාංකීය බැංකු, ප්‍රතිලාභීන් හා පෞද්ගලික අංශය විසින් මූල්‍යනය කිරීමට බලාපොරොත්තු වේ. ව්‍යාපෘතියේ කටයුතු 2016 අගෝස්තු 15 දින ආරම්භ කරන ලද අතර, 2021 අප්‍රේල් 23 දින වනවිට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතිය අවසන් කරන දිනය 2023 සැප්තැම්බර් 30 දින දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3 මතය**

2022 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කිරීම, සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තිරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6** මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධව විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

## 2. භෞතික කාර්යසාධනය

### 2.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

| සංරචකය | ක්‍රියාකාරකම | 2022 දෙසැම්බර් 31 දිනට | | විගණන නිරීක්ෂණය | ප්‍රමාදයට හේතු | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත භෞතික කාර්යසාධනය ඒකක | ළඟා කරගෙන ඇති කාර්යසාධනය ඒකක | | | | |
| කුඩා තේ වතු හිමියන්ගේ සංවර්ධනය | කුඩා තේ වතු හිමියන් සඳහා වෙළඳ පොළ මත පදනම් වූ නිෂ්පාදන සහාය | හෙක්. 4,500 . | හෙක්. 2,465 | 2016 සිට 2022 ජුනි 30 දක්වා තෝරාගත් දිස්ත්‍රික්ක හයක තේ ඉඩම් හෙක්ටයාර් 5500ක් ප්‍රතිසංස්කරණය කර නැවත වගා කිරීමට ව්‍යාපෘතිය විසින් සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, සැලසුම් කළ පරිදි 2016 දී ව්‍යාපෘතියේ මෙහෙයුම් ආරම්භ කිරීමට නොහැකි වීම හේතුවෙන් තේ ඉඩම් ප්‍රතිසංස්කරණය කර නැවත වගා කිරීමේ ඉලක්කය හෙක්ටයාර් 4,500 දක්වා සංශෝධනය කරන ලදී. කෙසේ වෙතත්, හෙක්ටයාර 2,035ක තේ නැවත වගා කර නොතිබුණි. | තේ නැවත වගා කිරීම සඳහා සහනාධාර ගෙවීමේ පසුබෑම | ඉලක්කය සපුරා ගැනීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් උපාය මාර්ග ක්‍රියාත්මක කරන ලද අතර 2023.09.30 වන දින ව්‍යාපෘතිය අවසන් කිරීමට පෙර ඉතිරි හෙක්ටයාර් 2,035 ක තේ නැවත වගා කිරීමට අපේක්ෂිතය. | සැලසුමේ ක්‍රියාකාරකම් ව්‍යාපෘති කාල සීමාව තුළ නියමිත පරිදි ප්‍රමාදයකින් තොරව සිදු කළ යුතු අතර ප්‍රතිපාදන ආර්ථිකමය ආකාරයෙන් භාවිතා කළ යුතුය. |

### 2.2 ඌන උපයෝජිත සම්පත්

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අම්පාර දිස්ත්‍රික්කයේ කුඩා රබර් වතු හිමියන්ගේ රබර් ඉඩම් හෙක්ටයාර 213කින් හෙක්ටයාර 122ක් සහ මොනරාගල දිස්ත්‍රික්කයේ කුඩා රබර් වතු හිමියන්ගේ රබර් ඉඩම් හෙක්ටයාර 359කින් හෙක්ටයාර 227ක් 2022 දෙසැම්බර් 31 දිනට අසාර්ථක වී තිබුණි. කෙසේ වෙතත් වගා ආධාර වශයෙන් රු. මිලියන 4ක් සහ රු. මිලියන 7ක් පිළිවෙළින් අම්පාර සහ මොනරාගල දිස්ත්‍රික්කවල අසාර්ථක කුඩා රබර් වතු හිමියන්ට ලබා දී තිබුණි. | මුන්දෙනිආරු ජලාශය සඳහා රජයට පවරාගත් ඉඩම් සහ වනසතුන්ගේ තර්ජන, ලැව්ගිනි, දැඩි නියං තත්ත්වයන් ආදිය හේතුවෙන් සිදු වූ වගා හානි ආදිය අසාර්ථක වගාවන්ට හේතු විය. | සැලසුමේ ක්‍රියාකාරකම් ව්‍යාපෘති කාල සීමාව තුළ නියමිත පරිදි ප්‍රමාදයකින් තොරව සිදු කළ යුතු අතර ප්‍රතිපාදන ආර්ථිකමය ලෙස භාවිතා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සහනාධාර ක්‍රමය යටතේ 2017 සිට 2022 දක්වා දිස්ත්‍රික්ක හයේ හෙක්ටයාර 578 ක මුළු භූමි ප්‍රමාණයක තේ නැවත වගා කිරීමට බලපත්‍ර ලබාගත් ප්‍රතිලාභීන් 2523 දෙනෙකු ඉඩම් මැනීමේ ප්‍රමාදය සහ තණකොළ සිටුවීමේ ප්‍රමාදය වැනි විවිධ හේතූන් මත රු. මිලියන 87 ක මුල් ගෙවීම් ලබාගෙන කිසිදු කටයුත්තක් ආරම්භ කර නොතිබුණි. | තේ නැවත වගා කිරීමේ ව්‍යාපෘතිය දිරිගැන්වීම වෙනුවෙන් හෙක්ටයාරයකට රු. 150,000 ක පෙර ගෙවීමක් ප්‍රාග්ධන ප්‍රදානයක් ලෙස පැරණි තේ ඉවත් කිරීම සහ ඉතිරිය ඉඩම් සකස් කිරීම අර්ධ වශයෙන් මූල්‍යනය සඳහා ලබා දී තිබුණි. TSHDA හි තේ පරීක්ෂකවරුන්ගේ නිර්දේශය ඇතිව තේ නැවත වගා කිරීමට අදහස් කරන සත්‍ය ප්‍රදේශය සලකා බලා ගෙවීම් සිදු කරන ලදී. අය කර ගැනීම සඳහා උපාය මාර්ග ක්‍රියාත්මක කරන ලද අතර නව උපාය මාර්ග යටතේ සංරචනය කිරීමට පරිවර්තනය කරන ලදී. 2023 සැප්තැම්බර් මාසයට පෙර තේ නැවත වගා කිරීම අවසන් කිරීමට නියමිතය. | තීරණය කරන ලද ක්‍රියාකාරකම් ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ අධීක්ෂණය තුළින් සිදු කළ යුතුය. |
| (ඇ) | රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් අම්පාර දිස්ත්‍රික්කයේ පදියතලාව පිහිටි තවානෙන් වසරකට රබර් පැල 250,000ක් සැපයීමට හැකියාව ඇති කිරීම සහ ව්‍යාපෘතියේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ව්‍යාපෘතිය විසින් රු. මිලියන 45ක් වෙන් කර ඇති අතර සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතිය මගින් තවාන සංවර්ධනය කිරීම සඳහා රු. මිලියන 7ක් වැය කර තිබුණි. කෙසේ වෙතත් ව්‍යාපෘතියට එහි තවානෙන් රබර් පැල 40,365ක් පමණක් ලබා ගැනීමට හැකිව තිබූ අතර ඉතිරි ප්‍රමාණය අනෙකුත් තවාන් වලින් මිලදී ගෙන ඇති අතර ප්‍රවාහනය සඳහා අමතර වශයෙන් රු. මිලියන 22ක් වැය කර තිබුණි. | 2023.05.31 දිනට ව්‍යාපෘතිය මගින් සංවර්ධන කටයුතු සඳහා රු. මිලියන 53.69ක් මූල්‍යනය කර තිබුණි. 2022 වර්ෂය තුළ පදියතලාව තවාන මගින් සපයන ලද මුළු අංකුර රබර් පැල සංඛ්‍යාව 40,365 කි. ඉතිරි අවශ්‍යතාවය වන 325,039 න් RDD හි අනෙකුත් තවාන් මගින් සපයනු ලැබුවේ පැල 312,417 ක් පමණි.<br>2022 වසර තුළදී, ව්‍යාපෘතිය මගින් අම්පාර සහ මොණරාගල දිස්ත්‍රික්කවල ප්‍රතිලාභීන්ගේ ඉඩම් වෙත ප්‍රසම්පාදනය කරන ලද අංකුර රබර් පැල බෙදා හැරීම සඳහා රු. 22,097,293 ක ප්‍රවාහන වියදමක් දැරීමට සිදු විය. | අනවශ්‍ය වියදම් අවම කර ගැනීම සඳහා අදාළ සියලු කටයුතු නියමිත කාලය තුළ සිදු කළ යුතුය. |
| (ඈ) | තේ වගාකරුවන්ගේ ව්‍යාප්ති සේවා සඳහා රු. මිලියන 2ක් සහ ප්‍රතිපාදනයෙන් සියයට 94ක් වැය කර තිබුණද සමාලෝචිත වර්ෂය වන විට සියයට 38ක භෞතික ප්‍රගතියක් පමණක් ලබාගෙන තිබුණි. | ව්‍යාපෘතියේ පාලනයෙන් පරිබාහිරව සිදු වන ඉන්ධන මිල අඛණ්ඩව ඉහළ යාම සහ ප්‍රවාහනය, නවාතැන්, ආහාර, බීම වර්ග වැනි අනෙකුත් වියදම්වල ඉහළ මිල මට්ටම් හේතුවෙන්, 2022 වර්ෂය තුළ ලබා දී ඇති ප්‍රතිපාදන තුළ සීමිත වැඩසටහන් ප්‍රමාණයක් පැවැත්වීමට සිදු විය. | සැලසුමේ ක්‍රියාකාරකම් ව්‍යාපෘති කාල සීමාව තුළ සැලසුම් කළ පරිදි ආර්ථිකමය ලෙස සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | කුඩා පරිමාණ රබර් සැකසුම් ඒකක 50ක් ස්ථාපිත කිරීම සඳහා රු. මිලියන 67ක් සහ වෙන් කළ මුදලින් සියයට 93ක් භාවිතා කර තිබුණද 2023 ජූනි 14 වන දින ඒකක 33ක් පමණක් නිම කර තිබුණි. | ව්‍යාපෘතියේ PDR අනුව විශාල පරිමාණ සැකසුම් ඒකක 48ක් පමණක් යෝජනා කර තිබුණි. RRI සහ ව්‍යාපෘතිය අතර සහයෝගීතාවයෙන් සිදු කරන ලද ක්ෂේත්‍ර මට්ටමේ තක්සේරුව මත පදනම්ව ඉලක්කය රබර් සැකසුම් මධ්‍යස්ථාන 48ක් වුවද, මසකට කිලෝග්‍රෑම් 50 සිට 100 දක්වා සැකසුම් ධාරිතාවයෙන් ඒකක 50ක් ස්ථාපිත කිරීමට තීරණය කර ඇත. | ආර්ථිකමය ලෙස ඉලක්ක ළඟා කර ගත යුතුය. |

## 2.3 අක්‍රීය සම්පත්

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතිය විසින් සකස් කරන ලද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව, 2022 වසරේ ග්‍රාමීය මූල්‍යකරණය යටතේ ජාතික මට්ටමේ දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා රු. 500,000ක් වෙන් කර තිබුණද එම කටයුතු සිදු කර නොතිබුණි. | ණය යෝජනා ක්‍රමයේ අදියර ii අනුමත කිරීම සඳහා අපහසු ක්‍රියාපටිපාටිය අනුගමනය කිරීම නිසා අදියර II ආරම්භ කිරීම 2023.05.01 දින සිදු කරන ලද අතර, 2022 වසරේ ජාතික මට්ටමේ දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා ප්‍රතිපාදන සැලසුම් කළ පරිදි ප්‍රයෝජනයට ගැනීමට නොහැකි විය. | ප්‍රතිපාදන නියමිත වේලාවට සහ ආර්ථිකමය ලෙස ප්‍රයෝජනයට ගත යුතුය. |
| (ආ) | රබර් වගාවට අදාළ ආදර්ශ කාබනික ගම්මාන පිහිටුවීම සඳහා රු. මිලියන 8ක් වෙන් කර රු. මිලියන 2ක් වැය කළද ඉන්ධන ගැටලුවට අදාළ ප්‍රායෝගික දුෂ්කරතා හේතුවෙන් එය නතර වී තිබුණි. | සමාලෝචිත වර්ෂය තුළ රට පුරා පැවති ඉන්ධන අර්බුදය සහ දරාගත නොහැකි ඉන්ධන මිල ඉහළ යාම, භාණ්ඩ හා සේවා මත පාලනය කළ නොහැකි ඉහළ උද්ධමනය සහ ආනයන සීමා කිරීම් නිසා උපකරණ අවශ්‍යතාවල හිඟය හේතුවෙන් තවදුරටත් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම අත්හිටුවන ලදී. | ප්‍රතිපාදන හා වියදම් වඩා හොඳ ප්‍රතිඵලයක් සඳහා යොදා ගත යුතුය. |